සිරිධම්මවංසාලංකාර සාසනජෝති ගෞරව
නාම සහිත කොළඹ දිසාවේ ප්‍රධාන සංඝ නායක
ධුරයෙන් පිදුම් ලැබූ

# ශාස්ත්‍රපති
# ගරු බෝගම්බර රතනජෝති
# ස්වාමින් වහන්සේ


**සම්පාදක**

පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයෙහි පර්යේෂණ සහකාර,
කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආගන්තුක කථිකාචාර්ය,

**දර්ශනපති මඩිහේ සුගතසිරි හිමි**



**ප්‍රථම මුද්‍රණය - 2014**

**සංස්කරණ සහය**

**ශාස්ත්‍රපති**
**වැලිමඩ චන්දවිමල හිමි**
**බෝගම්බර අරියරතන හිමි**

මුද්‍රණ අනුග්‍රහය

**ශ්‍රී සුචරිත වර්ධන දහම් පාසලේ ඉංග්‍රීසි අංශය**

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුක: 011 4 870 333

# අභිනන්දන ගීතය

අවිදු අඳුරු ඝන තිමිර පටල බිඳ
බුදු සසුනඹරෙහි දිදුලන පුරහඳ
බෝගම්බර සිරි රතනජෝති අතිගරු නාහිමි සමිඳේ
සුපටිපන්න ගුණයෙන් පිරි ඔබෙ ගුණ බැතින් ගයමි නිබඳේ

සිරිදම් අරමෙහි අධිපති විලසින
බොදු දරු කැලකගෙ යහපත සලසන
විසිරී සිටි නගරයෙ වැසි නෙක දන
එකමුතු මාවතකට කැඳවා යන
බෝගම්බර සිරි රතනජෝති අතිගරු නාහිමි සමිඳේ
උජුපටිපන්න ගුණෙන් පිරි ඔබ ලග රැඳී හිඳිමි නිබඳේ
චිරං ජයතු සමිඳේ //

අටලෝදම අබිමුවෙහි අකම්පිත
මානවාවාදි ගුණෙන් සමලංකෘත
ධර්ම සුගායන නාම විභූෂිත
ශාසනවංස සදා අපරාජිත
බෝගම්බර සිරි රතනජෝති අතිගරු නාහිමි සමිඳේ
ශීල සමාධි ගුණෙන් යුතු ඔබෙ පා බැතින් වඳිමි නිබඳේ
චිරං ජයතු සමිඳේ//

පදරචනය - විශාරද බණ්ඩාර ඇහැළියගොඩ
තනු නිර්මාණය - විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා
ගායනය - විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා
- විශාරද චරිතා ප්‍රියදර්ශනී පීරිස් මහත්මිය
- විශාරද ශාලිකා ඉෂාන් මහතා

සිරිධම්මාරාමාධිපති පූජ්‍ය ශාස්ත්‍රපති බෝගම්බර රතනජෝති හිමියන්හට සාසනික වශයෙන් ප්‍රදේශයටත් රටටත් ඉටු කරන ලද සේවාවන් හා සාමාජික සේවාවන් අගයමින් ''සිරිධම්මවංශාලංකාර ශාසනජෝති'' ගෞරව නාම සහිත කොළඹ දිසාවේ ප්‍රධාන සංඝ නායක ධූරයෙන් උපහාර පිරිනැමීම පිළිබඳ මාගේ ශුභාශිංසන මෙසේ පිරිනමමි. පූජ්‍ය රතනජොති ස්ථවිරයන් හට තුනුරුවනේ අනන්ත ගුණ බලයෙන් තවත් බොහෝ කලක් බුද්ධ ශාසනයට හා සමාජයට සේවාවන් කිරීමට ශක්තිය වීර්යය ලැබේවායි මම ආශිංසන කරමි.

මෙයට
සාසනස්ථිතිකාමී
**අතිපූජ්‍ය දවුල්දෙන ඥාණිස්සර මහා ස්ථවිර**
ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර
මහානායක ස්ථවිර.

මෙයින් සියවස් තුනකට මොබ නූතනය වනවිට පාර්ශ්ව විස්සකට පමණ බෙදී ඇති අමරපුර මහා නිකායේ සියලු පාර්ශ්වයන්ගේ ආරම්භය මෙන් ම රාමඤ්ඤ මහා නිකායෙහි ආරම්භය ද සනිටුහන් වනුයේ බුරුමයේ සුපේසල ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලාගේ තෝතැන්නක් බඳු වූ එදා අමරපුර රාමඤ්ඤ නමින් හැඳින් වූ ප්‍රදේශවලිනි.

ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ ආරම්භය සිදු වනුයේ බුරුම රටෙන් මෙරටට වැඩම වූ විනයාලංකාර මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගෙනි. එබැවින් තත් නිකාය අසම්භින්න, මෙන්ඩුන් මහ රජුගේ ගෞරවාදරයට මහත් සම්භාවනාවට පාත්‍ර වූ භික්ෂු වංශයකි.

ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය භික්ෂු විහාර පරම්පරා හතරකින් සංගෘහිත භික්ෂු සංවිධානයකි. දෙමටගොඩ විහාර පාර්ශවය, පොකුණුවිට විහාර පාර්ශවය, කඳුබොඩ භාවනා මධ්‍යස්ථානස්ථ විහාර පාර්ශවය කඳුරට විහාර පාර්ශවය වශයෙනි. මෙයින් දෙමටගොඩ විහාර පාර්ශ්වය, දිගු කලක් බුරුම රටේ වෙසෙමින් පර්යාප්තිය මැනවින් උගත් විනය ගරුක ආකල්ප සම්පත්තියෙන් හෙබි ගෞරවාස්පද අරංගල සිරිධම්ම, පූජනීය උඩුවේ විමලරංසි, දෙවිනුවර ඤාණාවාස යන මහනාහිමිපාණන් වහන්සේලාගෙන් හා ගරුතර නාරම්පනාවේ පඤ්ඤාරංසි යන යති ශ්‍රේෂ්ඨයන් වහන්සේලා නිසා ශ්‍රී ලංකා ශ්වේජින් මහ නිකාය ශක්තිමත් විය.

අද දින කොළඹ දිසාවේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලබන නුගේගොඩ සිරි ධම්මාරාමාධිපති ශාස්ත්‍රපති ගෞරවාර්හ බෝගම්බර රතනජොති ස්ථවිරයන් වහන්සේ යථෝක්ත භික්ෂු පරපුරෙහි ගරුතර බෝවල සිරිපවර, නාරම්පනාවේ පඤ්ඤාරංසි අනුනාහිමි, කනන්විල තේජෝසාර අධිකරණ සංඝනායක නාහිමි යන ශ්‍රෙෂ්ඨ සංඝපිතෘන් වහන්සේලාගේ ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේ නමකි. උන්වහන්සේ තත් විහාර පාර්ශ්වයේ වැඩිහිටි භික්ෂූන් වහන්සේ නමක් ද උගත් භික්ෂූන් වහන්සේලා පිරිසකගේ ආචාර්යවරයාණෝ ද වෙති.

මැතභාගයේ නුගේගොඩ සිරිධම්මාරාමය සුවිසල් ආගමික ජාතික මෙන් ම සමාජ සේවාවන් රැසක් සිදු කරන දැකුම්කළු සියලු විහාරංගයන්ගෙන් සපිරුණු එම ප්‍රදේශයේ වැදගත් තැනක පවතින



විහාරස්ථානයක් බවට පත් කිරීමෙහි ලා නව සංඝනායක පදවියෙන් පිදුම් ලබන පූජ්‍ය බෝගම්බර රතනජෝති හිමියන් මහත් කැපවීමකින් කටයුතු කළහ. විවිධ අධ්‍යාපන ආයතනයන්හි ප්‍රශස්ත ගුරු සේවාවක ද යෙදෙමින් නිකායික කටයුතුවලට ද දක්වන කැපවීම අගයමින් කලකට උඩදීශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ කර්මාචාර්ය පදවියකින් ද කාරක සංඝ සභික ධුරයකින් ද සම්මානිත උන්වහන්සේට පසුගිය දා රැස් වූ විංසත් වර්ගික කාරක සංඝ සභා රැස්වීමේදී ''සිරිධම්මවංසාලංකාර සාසනජොති'' යන ගෞරව නාමය සහිත කොළඹ දිසාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනමන්නට යෙදිණි. ගරු කටයුතු ශාස්ත්‍රපති බෝගම්බර රතනජෝති ස්ථවිරයාණන්ට අපගේ බලවත් ප්‍රසාදය ද ශතවර්ෂාධික කාලයක් අප නිකායටත් ශ්‍රී ලාංකේය භික්ෂු පරපුරටත් රටට සහ ජාතියටත් පෘථුල සේවාවක් කරන්නට තිසරණ සරණින් සම්දිටු දෙව් රැකවරණින් සියලු ශක්තිය ලැබේවායි ආශිංසනය කරම්හ.

මහාකර්මස්ථානචායයී, විනයාචාරිය
**පූජ්‍ය ඉඟුරුවත්තේ පියනන්ද මහා ස්ථවිර,**
ශ්‍රී ලංකා ග්වේජින් නිකායේ මහා නායක ස්ථවිර

ධර්මාචාර්යවරයෙකු ආගමික සාමාජික හා ශාසනික මෙහෙවරක යෙදුනු ආදර්ශ සම්පන්න මහා තෙරනමක් වශයෙන් නොසිතූ නොපැතූ තනතුරක් නිරායාශයෙන්ම උන්වහනසේට හිමිවිය. උන්වහන්සේගෙන් අදාළ තනතුර ශෝභමාන වේවා

බෝගම්බර රතනජෝති නාහිමියන්ගේ පිය ශිෂ්‍ය බෝගම්බර මෛත්‍රීරතන, බෝගම්බර අරියරතන හා හක්මණ ධම්මරතන යන හිමිවරු තම ගුරුදේවයන් වෙනුවෙන් උපහාර පිණිස මෙවැනි අභිනන්දන ග්‍රන්ථයක් පළකරවීම බෙහෙවින් අගය කළයුතු අතර, හැමගේ කෘතඥතා පූර්වක ස්තුතිය ද උන්වහන්සේලාට හිමි වනු ඇත.

ශ්‍රී ලංකා අමරපුර ස්වෙජින් මහා නිකායේ අනුනායක
**අතිපූජ්‍ය පත්බේරියේ සිරිනිවාස ස්ථවිර**



### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
### අතිගරු ජනාධිපතිතුමාගේ

## ශුභාශිංසන පණිවුඩය

නුගේගොඩ සිරිධම්මාරාම මහා විහාරාධිපති ගෞරවාර්හ බෝගම්බර රතනජෝති නායක ස්වාමීන් වහන්සේ වෙත ශ්‍රී ලංකා අමරපුර ස්වේජින් සංඝ සභාව මගින් ''සිරිධම්මවංසාලංකාර සාසනජෝති'' යන ගෞරව නාම සම්මුතිය සහිතව කොළඹ දිසාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනැමීම නිමිත්තෙන් ශුභාශිංසන පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳ මම අතිශයින් සතුටට පත්වෙමි.

නුගේගොඩ සිරිධම්මාරාම විහාරය ශ්‍රී ලංකා අමරපුර ශ්වේජින් මහා නිකායට අයත් විහාරස්ථානයකි. ශ්‍රී ලංකා අමරපුර ස්වේජින් මහා නිකාය බැබළ වූ මහ සඟ පරපුර අතර අතිගෞරවාර්හ අරංගල සිරිධම්ම මහානායක ස්වාමීන් වහන්සේ, ගෞරවාර්හ දෙවිනුවර ඥානාවාස ස්වාමීන් වහන්සේ වැනි අභිධර්ම විශාරද නායක ස්වාමීන් වහන්සේලා වෙති.

නුගේගොඩ නගර සංවර්ධනයට සමගාමීව ස්වකීය විහාරස්ථානය බෞද්ධයන්ගේ වන්දනාමාන කටයුතු වෙනුවෙන් සියලු විහාරාංගයන්ගෙන් සමන්විත කොට දර්ශනීය ආකාරයෙන් ගොඩනැගීමට ගෞරවාර්හ බෝගම්බර රතනජෝති නායක ස්වාමීන් වහන්සේ කටයුතු කළ ආකාරය ප්‍රශංසනීය ය. ගිහි පැවිදි සැමගේ ගෞරවාදරයට පාත්‍ර වෙමින් සාරධර්ම සපිරුණු සමාජයක් ගොඩ නැගීම උදෙසා ස්වකීය විහාරස්ථානය මුල් කොටගෙන උන්වහන්සේ විසින් සිදු කරනු ලබන ශාසනික හා සාමාජික මෙහෙවර මම ඉතා අගය කොට සලකමි.



ශාසනික කටයුතු අතරතුර තම කාලය හා ශ්‍රමය සුවිශාල ජාතික ආගමික හා සමාජ මෙහෙවරක් වෙනුවෙන් කැප කරමින් උන්වහන්සේ විසින් ලබා දෙන මාර්ගෝපදේශකත්වය සමස්ත සඟ පරපුරට ම පූර්වාදර්ශයක් බව මම විශ්වාස කරමි. සම්බුද්ධ ශාසනයට හා සමාජයේ යහපතට කටයුතු කරමින් තම ප්‍රව්‍රජ්‍යා ජීවිතය අර්ථාන්විතව ගතකරන උන්වහන්සේට අභිනව සංඝනායක පදවිය තුළින් ද සුවිශාල සේවාවක් සිදු කිරීම සඳහා අවස්ථාවක් හිමිවනු ඇති බව මම විශ්වාස කරමි.

සම්බුදු සසුන ඒකාලෝක කරවමින් ප්‍රඥාසම්පන්න ජන සමාජයක් ගොඩනැගීම සඳහා සිදු කරනු ලබන ලෝක ශාසනික සේවාවන් තවදුරටත් සිදු කිරීමට කොළඹ දිසාවේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලැබූ ගෞරවාර්හ බෝගම්බර රතනජෝති නායක ස්වාමීන් වහන්සේට නිදුක් නිරෝගීභාවය හා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබේවා යි මෙත් සිත් පෙරටුව ප්‍රාර්ථනා කරමි.

**මහින්ද රාජපක්ෂ**
අතිගරු ජනාධිපති

2014ක් වූ නොවැම්බර් මස 12 වන දිනදී ය.

දුර දක්නා නුවණින් ඉවසීම කැපවීම අප්‍රතිහත ධෛර්යය නිසා උන්වහන්සේ තම සාසනික දිවි මගේ මෙතෙක් දුර පැමිණි අතර පැවිදි දිවියෙන් වසර 36 ක් ද උපසම්පදාවෙන් වස් 30 ක් ද තම දිවි ගමනේ අනේක දුක්කම්කටොළු මැද තම දයාබර මව්පියන්ගෙන් හා ගුරු උතුමන්ගේ අනුශාසනා මග පෙන්වීම මත දැඩි අධිෂ්ඨානයෙන් යුතුව උන්වහන්සේ කටයුතු කරන බව නොරහසකි.

මෙතෙක් කලක් උන්වහන්සේ විසින් සිදු කරන ලද සියළු ආගමික ජාතික සේවාවන් වෙනුවෙන් අමරපුර ශ්වේජින් නිකායික කාරක සංඝ සභාව මගින් අප නායක ස්වාමින් වහන්සේට ''සිරිධම්මවංසාලංකාර සාසනජොති'' ගෞරව නාමය සහිත කොළඹ දිසාවේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමීම පිළිබඳ අතිශයින් ප්‍රීතියට පත්වන අතර ශ්‍රී සුචරිත වර්ධන දම් පියසේ සියළු ම ආචාර්ය මණ්ඩලය මෙන්ම ශිෂ්‍යනායක සංසදය ඇතුළු සියලු ම දහම් පාසලේ දරුවන්ගේ ආශිර්වාදය උන්වහන්සේ වෙත පිරිනමමි. උන්වහන්සේ විසින් සිදු කරනු ලබන සියලුම ජාතික ආගමික සේවාවන් තව තවත් හොඳින් සිදු කර ගැනීමට කායික හා මානසික ශක්තිය පතමි. උන්වහන්සේගේ දයාබර දෙමාපියන්ට ද තෙරුවන්ගේ ආශිර්වාදයෙන් නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කරමි.

තෙරුවන් සරණ යි !

**අසෝකා අමරසිංහ**

නියෝජ්‍ය විදුහල්පති

ශ්‍රී සුචරිතවර්ධන දහම් පාසල (සිංහල අංශය)

දිගු කලක පටන් උන්වහන්සේ ඇසුරු කළ මට විටෙක උන්වහන්සේ පියෙකි, සොහොයුරෙකි, කළණ මිතුරෙකි. සසර මග කෙටි කර සඟමොක් මඟ කියාදෙන යතිවරයෙකි. අපමණ දුක් ගැහැට බාධක පීඩා හමුවේ නොසැලී සිටියේය. තම පෞද්ගලික සුව පහසුව ද නොතකමින් දිවා රෑ නොබලා සම්බුදු සසුන රට දූය සමය වෙනුවෙන් තම ජීවිතය කැප කළ උන්වහන්සේටත් උන්වහන්සේ වැනි බුද්ධ පුත්‍රයකු සසුනට පුජා කළ දයාබර මව්පිය දෙපලටත් ඔවදන් දී සසුන් මග සරු කළ පැවිදි ගුරු උතුමාණන්ටත් දෙලොවට සුව පිණිසම හේතුවේවායි මගේ පැතුමයි. හිමියනි, ඔබ වහන්සේගේ සාසනික ආගමික ජාතික සියලු සේවාව වඩ වඩාත් සාර්ථකත්වයට පත්වීමට මෙම වටිනා සංඝ නායක ධුරය හේතුවේවා යි ද පතමි.

**මහින්ද වික්‍රමසිංහ**
ප්‍රධාන සංවිධායක දායක, සභාව
සහ උත්සව සංවිධායක කමිටුව



# ගුරු නාහිමිපාණන් වහන්සේගේ ජීවන තොරතුරු

## ළමා අවධිය

ඓතිහාසික කන්ද උඩරට මාතලේ දිස්ත්‍රික්කයේ කයිකාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෝගම්බර නම් ඓතිහාසික ග්‍රාමය, වළගම්බා රජ සමයට අයත් බොහෝ ගම්වල භාරකාරත්වය දරණ ඉතා පැරණි දේවාලයක් නිසා මෙම ග්‍රාමයට බෝගම්බර යන නාමය යෙදී ඇති බව ජනප්‍රවාදය යි. ඉතා රමණීය කෙත් වතු ඇළ දොළ ගංගා කඳුවලින් හෙබි බෝගම්බර ග්‍රාමයෙහි සම්භාවනීය ඉතා පැරණි පවුලක් වන අලහකෝන් පවුලට අයත් අලහකෝන් මුදියන්සේලාගේ කළුබණ්ඩා අලහකෝන් ගම්සභාපතිතුමාට සහ බෝගම්බර බී ජනපදයේ සම්භාවනීය පවුලක කුලකාන්තාවක වූ නාරසිංහ මුදියන්සේලාගේ රණසිංහ මැණිකේ යන මව්පිය දෙපළට දාව සත් දෙනෙකුගෙන් යුත් පවුලක දෙවැනියා වශයෙන් 1962 දෙසැම්බර් 24 දින පින්වත් කුමරකු මෙලොව එළිය දුටුවේ ය. බණ්ඩාර රත්න නම් වූ මේ පුණ්‍යවන්ත දරුවා කුඩා කල පටන් ම පවුලේ අන් අයට වඩා සුවිශේෂී ගතිගුණවලින් හෙබි දරුවෙක් විය. තම ආගම දහම කෙරෙහි ඉතා ම සංවේදී බවකින් කටයුතු කළ කුඩා දරුවා තම මිත්තණිය සමග නිතර ගමේ විහාරස්ථානයට යෑමට, පෙහෙවස් සමාදන් වීමට මෙන් ම වන්දනාමාන ආදිය කෙරෙහි වැඩි රුචිකත්වයක් දැක්වූයේ පූර්වකෘත පුණ්‍යභාවය නිසා විය යුතු ය.

මේ පුණ්‍යවන්ත කුඩා කුමරුගේ මව්පියන් ද නිතර දන්දීම් ආදි පුණ්‍ය කටයුතුවල නියුතු වූ යුවතිපතින් වූ බැවින් මෙම නිවසට භික්ෂූන් වහන්සේලාගේ වැඩමවීම ද බණ්ඩාරරත්නගේ පින් සිතිවිලි දියුණු වීමට හේතු විය. එසේ තම නිවසේ නිතර සිදු කරන දන්පින්කම් ආදී ආගමික වතාවත් නිසා දහමට ලොකු ඇල්මක් ඇති වීමටත්, සිය මිත්තණිය (මවගේ මව) නිතර කියා දෙන බණ කතා අවවාද අනුශාසනා ශ්‍රවණය කිරීමත්, දෙමාපියන්ගේ නිසි මග පෙන්වීමත් නිසා ගුණ යහපත් ජීවිත පදනමක් ඇතිකර ගැනීමටත් මහත් පිටුවහලක් ලැබුණි.

මිනිසෙකු වශයෙන් ජන්මලාභය ලබන්නෙකුට ඇති සුවිශේෂි ආභරණය වන අධ්‍යාපනය ලබා ගැනීමට මේ දරුවා 1967 ජනවාරි මූලික අධ්‍යාපනය ලැබීම සඳහා මා/ කොස්වාන කනිෂ්ඨ විද්‍යාලයට ඇතුළත් විය. මවුපියන්ගේ උපදෙස් මත අධ්‍යාපනය උනන්දුවෙන් සිදු කළ නිසා සෑම වාර පරීක්ෂණයකින් ම පන්තියේ පළමුවැනියා හෝ දෙවැනියා බවට පත්වීමට බණ්ඩාරරත්න සමත් විය. වසර කිහිපයක් තම ශක්‍යතාව ඔප්නංවා ගනිමින් අධ්‍යයන කටයුතුවල යෙදුණු මේ පුතා 1977 වර්ෂයේ 9 වන ශ්‍රේණිය සමත් වීමෙන් පසු 1978 ජනවාරි කයිකාවල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වී තම අධ්‍යාපනයෙහි නිම්වළලු පුලුල් කර ගත්තේය.

ගමේ විහාරස්ථානය ගමට ආභරණයකි. නිතර ම විහාරස්ථානයෙහි පවත්වනු ලබන ආගමික කටයුතු නිසා බොහෝ පිරිසක් නිතරම විහාරස්ථානය සහ සමීපව කටයුතු කළ අතර අපේ කුඩා පුතු ද මව්පිය සොයුරු සොයුරියන් සමග ආගමික කටයුතුවලට පන්සලට ගිය අතර පන්සල සමග ලොකු ඇල්මකින් කටයුතු කළේ ය. සිය මිත්තණිය සමග නිතර සිල් සමාදන්වීමට ගමේ විහාරස්ථානයට ගිය කුඩා පුතුට ගමේ පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ඇසුරු කිරීමටත්, උන්වහන්සේගේ කාරුණික සෙනෙහසත්, නිසා පැවිදි ජීවිතය පිළිබඳ ලොකු ඇල්මක් ඇති වී තිබුණි.

වයස අවු. 8 ක පමණ සිට ම පැවිදිවීමට ඇති ආශාව පිළිබඳ සිය මවුපියන්ට දැන්වූ පසුව දෙමව්පියන් ඒ පිළිබඳ සතුටු වුව ද දරුවාගෙන් ඈත්වීමට ඇති වේදනාව නිසා ම ඊට තම එකඟතාව පළ කිරීමට මැළි වූහ.

කුඩා දරුවන් සමග කෙළි සෙල්ලම් කරන අතරතුර ඉඩ ලද හැම මොහොතක ම ඇතිරිල්ලක් සිවුරක් ලෙස පොරවාගෙන දෙල් කොළයක් වටා පතක් ලෙස අතට ගෙන අන් මිතුරන් වාඩි කරවාගෙන ධර්ම දේශනා කරන පිරිත් කියන දසුන් නිතර නිතර දකින දෙමව්පියන්ට තම දරුවා පැවිදිවීමේ ගමන නැවැත්විය නො හැකි බව වැටහී තිබුණි.

නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානයෙහි ආදි කතෘ බෝවල සිරි පවර නාහිමියන්ගේ ශිෂ්‍යයකු ලෙස දිගු කලක් සිටි විජේසිරි



තිලකරත්න මහතා මුණ ගැසීමට මාතලේට වැඩම කළ දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිපති අතිපූජ්‍ය නාරම්පනාවේ පඤ්ඤාරංසි අනුනායක ස්වාමිපාදයන් වහන්සේ මුණ ගැසීමට මේ පින්වත් කුමරාට අවස්ථාව උදා වූ අතර උන්වහන්සේගේ ප්‍රසන්න පෙනුම සහ කාරුණික වදන් පැවිදි වීමේ බලාපොරොත්තු තව තවත් වැඩි කරවීමට හේතු විය. උන්වහන්සේගේ ඉල්ලීමට එකඟ වූ පසු පැවිදිවීම සඳහා තම පියතුමන් සමග කිරුළපන අතපත්තු නිවසට 1978 පෙබරවාරි 21 දින පැමිණි අතර පසුදින එනම් 22 දින තවත් කුල දරුවන් සය දෙනෙකු සමග පැවිදි කිරීමේ පින්කම සූදානම් කොට තිබුණි. දරු සෙනෙහස වාවනු බැරි පියතුමන් අවසන් මොහොතේ ද නැවත ගෙදර යාමට ඉල්ලා සිටින විට මේ දරුවා නැවත ද ඉතා දැඩි ලෙස කියා සිටියේ තමා පැමිණියේ පැවිදිවීමට මිස නැවත යාමට නො වන බව යි. මෙම දරුවාගේ කැමැත්ත වෙනස් කළ නො හැකි බව වටහාගත් පියා එහි දී නිහඬ වූයේ මේ ආසාව මොහුගේ සසර පුරුද්දක් විය යුතු බව වටහා ගැනීමෙනි.

නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානයේ සිට අලංකාර රිය පෙරහැරකින් දෙමටගොඩ මහා විසුද්ධාරාම මහා විහාරස්ථානයට පැමිණ නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානයෙහි ආදි කර්තෘ ආභිධම්මිකාචාර්ය ගරු බෝවල සිරි පවර මහානායක ස්වාමිපාදයන් වහන්සේ, දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිපති අති පූජ්‍ය නාරම්පනාවේ පඤ්ඤාරංසි අනුනායක ස්වාමිපාදයාණන් වහන්සේ හා ගරු කණන්විල තේජෝසාර අධිකරණ නායක ස්වාමීන් වහන්සේ යන ගෞරවනීය ස්වාමීන් වහන්සේලා තුන් නමගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් 1978 පෙබරවාරි 22 දින සවස 7.00 ට යෙදුණු සුභ මුහුර්තයෙන් බණ්ඩාරරත්න නම් මෙම පුණ්‍යවන්ත කුල කුමරුවා ගේ ප්‍රව්‍රජ්‍යාභිෂේකය සිදු විය. බෝගම්බර රතනජෝති නමින් පැවිදි කරනු ලැබූ මෙම කුඩා සාමණේරයන් වහන්සේ ගුරු දේවෝත්තමයන් වහන්සේලාගේ උපදෙස් මත මාස කිහිපයක් ම සාමණේර පැවිද්ද සඳහා අවශ්‍ය බණ දහම් වනපොත් කරමින් ආචාර්ය, උපාධ්‍යාය, ආරාමික ආදි වතාවත් ආදියෙහි නියුක්ත වෙමින් තම ප්‍රවජ්‍යාභිමතය සාධනය කරගනු වස් මහත් වූ ප්‍රයත්නයක නියුක්ත විය.

## අධ්‍යාපන කටයුතු

1978 ජුලි මස 18 දින දෙමටගොඩ මහ විසුද්ධාරාමාධිපති ව වැඩ විසූ නාරම්පනාවේ පඤ්ඤාරංසි අනුනාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් මහා විසුද්ධාරාම ත්‍රිපිටක පිරිවෙණ පැවිදි සිසුන් 18 නමකගෙන් ආරම්භ වූ අතර එහි ප්‍රථමයෙන් ලියාපදිංචි කළ ශිෂ්‍යයා වීමේ භාග්‍යය ද අප රතනජෝති පොඩි හාමුදුරුවන් වහන්සේට හිමිවිය.

සිව් වසරක කාලයක් තුළ ගුරු උතුමන්ගේ ආදර ගෞරව දිනාගෙන මූලික පිරිවෙන් අධ්‍යාපනය නිමකර 1980 වර්ෂයේ මූලික පිරිවෙන් අවසාන විභාගයට ඉදිරිපත් වී ඉන් ලැබූ සාමාර්ථය මත 1982 වර්ෂයේ දී මාළිගාකන්ද විද්‍යෝදය මහ පිරිවෙණෙහි ප්‍රාචීන ප්‍රාරම්භ පන්තියට ඇතුළත් විය. ඉන්පසු 1982 වර්ෂයේ ප්‍රාචීන ප්‍රාරම්භ පරික්ෂණය ද 1983 වර්ෂයේ ප්‍රාචීන මධ්‍යම පරික්ෂණය ද සමත් විය.

1984 වර්ෂයේ අධ්‍යායන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට ඉදිරිපත් වී ඉතා විශිෂ්ඨ ලෙස සමත් වූ ගරු රතනජෝති හිමියෝ 1985/86 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයට තේරී පත් වූහ. මේ වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඉතා සංකීර්ණ සහ අර්බුදකාරී දේශපාලන වශයෙන් ඉතා ගැටුම්කාරී වාතාවරණයක පැවතුණි.

ගිහි පැවිදි බොහෝ ශිෂ්‍ය පිරිස් විප්ලවකාරී දේශපාලන පක්ෂවලට බැඳී තම අධ්‍යාපන කටයුතු පවා නො තකා කටයුතු කරන වකවානුවක අප රතනජෝති ස්වාමින් වහන්සේ කා සමගත් ඉතා මධ්‍යස්ථ ව සිටිමින් කිසිදු දේශපාලන කටයුත්තකට සම්බන්ධ නොවී තම භික්ෂු ගෞරවය ද රැක ගනිමින් උසස් අධ්‍යාපන කටයුතු ඉතා හොඳින් නිමකර 1991 වර්ෂයේ උපාධිය හිමිකර ගත්තේ ය.

මේ අතර ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම පිළිබඳ දැඩි ආශාවකින් කටයුතු කළ උන්වහන්සේ නොයෙකුත් අධ්‍යාපන ආයතනවලට සම්බන්ධ වී ඉංග්‍රීසි දැනුම වර්ධනය කර ගත්තේය. 1991 වර්ෂයේ බොරැල්ල ඇක්වයිනාස් ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාව ද සමත් ව ඉංග්‍රීසි දැනුමෙන් ද උන්වහන්සේ තම දැනුම උසස් මට්ටමකට පත් කර ගත්තේය.



## උපසම්පදාව

උගතමනා බණ දහම් සපුරා සිටි රතනජෝති සාමණේර ස්වාමින් වහන්සේ 1984 ජුනි මස 3 වන දින ශ්‍රී ලංකා අමරපුර ස්වේජින් මහා නිකායේ අතිගරු මහානායක ස්වාමින් වහන්සේ ඇතුළු කාරක සංඝ සභාව වෙතින් දෙමටගොඩ මහා විසුද්ධාරාම සාසනසෝභිනී සීමා මාලකයේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදා භූමියට පත්වූහ. එදින ම සවස් යාමයෙහි අලංකාර පෙරහැරකින් පඤ්චතූර්ය නාද මධ්‍යයෙහි වැඩම කරවන ලද රතනජෝති නවෝපසම්පන්න ස්වාමීන් වහන්සේ රාත්‍රියෙහි නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානයේ දී උන්වහන්සේගේ මංගල ධර්ම දේශනාව  සිදුකරන ලදි. එම දේශනාව අසා ප්‍රමුදිත වූ බොහෝ දායකයෝ මේ නවෝපසම්පන්නයන් වහන්සේගේ චතුර භාෂණයට හා සුමධුර වාග් විලාසයට ප්‍රසන්න වූහ. එසේ ප්‍රසන්න වූ ඇතැම් සැදැහැති දායක දායිකාවෝ අදත් සිවුපසයෙන් උපස්ථාන කරමින් ශාසනාභිවෘධියෙහි තත්පරව කටයුතු කරති.

නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානයට වැඩමවීම. පැවිදිවීමෙන් පසු දෙවසරක පමණ කාලයක් දෙමටගොඩ මහ විසුද්ධාරාම විහාරස්ථානයෙහි වැඩ වසමින් එහි මූලික පිරිවෙන් අවසාන විභාගය සිදුකරන අතරතුර නිරන්තර නුගේගොඩ විහාරස්ථානයට ද ආගමික කටයුතු සඳහා වැඩම කිරීමට අප රතනජෝති හිමියන්ට සිදු විය. ඒ වනවිට වයෝවෘද්ධ තත්ත්වයෙන් හා ගිලන්බැවින් වැඩසිටි නුගේගොඩ සිරිධම්මාරාම විහාරාධිපති ආභිධම්මිකාචාර්ය බෝවල සිරිපවර ස්වාමින් වහන්සේ දැඩි ලෙස ගිලන් වූ බැවින් කළුබෝවිල රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළත් කර සිටියහ. නිතර කළුබෝවිල රෝහලට යමින් එමින් උන්වහන්සේට අවශ්‍ය ප්‍රත්‍ය සපයා දෙමින් බැහැරින් ගෙනැවිත් දිය යුතු බෙහෙත් ආදිය සුදුසු කාලයේ දී සපයා දෙමින් අවශ්‍ය කටයුතු සාධනය කිරීමට රතනජෝති හිමියන්ට සිදුවිය. ගිලානෝපස්ථානය බුද්ධ උපස්ථානයක් වශයෙන් සැලකූ අප හිමියෝ තමාගේ අධ්‍යයන කටයුතු පසෙක දමා මේ මහානායක මාහිමිපාණන් වහන්සේට අවශ්‍ය උපස්ථාන කිරීමට යොමු වූහ. කිසියම් කටයුත්තක් සඳහා රෝහලෙන් බැහැරට ගිය

රතනජෝති හිමියෝ මහා නාහිමියන්ට අවශ්‍ය බෙහෙත් රාශියක් ද රැගෙන සවස 4.00 ට පමණ කළුබෝවිල රෝහලට යෑම සඳහා නුගේගොඩට පැමිණි විට දැන ගන්නට ලැබුණේ සවස 3 ට පමණ ගරු බෝවල සිරිපවර ස්වාමින් වහන්සේ අපවත් වූ ආරංචිය යි. ඒ 1980 ජුලි මස 10 වන දිනය යි. අපවත් වූ ගරු නා හිමියන්ගේ ආදාහන කටයුතු ජුලි මස 12 දින සිදු වූ අතර ඒ වන විට සිරිධම්මාරාම විහාරස්ථානයෙහි භාරකාරත්වය ගරු කනන්විල තේජෝසාර නාහිමිපාණන් වෙත පවරා තිබුණි. ගරු තේජෝසාර නාහිමියන් අප රතනජෝති හිමියන්ගේ ගතිගුණ හා හැකියාවන් පිළිබඳ ඉතා පැහැදීමෙන් සිටි නිසා උන්වහන්සේ සමග සිරි ධම්මාරාම විහාරස්ථානයෙහි නැවතීමට කළ ඉල්ලීම පිළිගත් හෙයින් රතනජොති හිමියන්ට එදා සිට සිරිධම්මාරාම විහාරස්ථානයෙහි වැඩ සිටීමට අවස්ථාව ලැබුණි. කවදත් ගුරු ගෞරවයෙන් සහ වැඩිහිටි යතිවරුන්ගේ අවවාදයට ඉතා මැනවින් කන් දීමට පුරුදුව සිටි රතනජෝති හිමියන්ට තේජෝසාර නාහිමියන්ට තමාගේ ගුරුදේවයන්ට මෙන් සලකමින් කටයුතු කරන්නට විය.

කාලාතික්‍රමණය වෙත් ම අතිගරු කනන්විල තේජෝසාර ගරු නායක ස්වාමින් වහන්සේ ද නිතර ම රෝගී තත්ත්වයට ගොදුරු වූ බැවින් විහාරස්ථානයේ ආගමික සාමාජික හා ශාසනික පොදු කටයුතු සෑම දෙයක් ම අනලස්ව කිරීමට සිදු වූ අතර ඒ සියල්ල ම සිදු කරමින් මහත් බාධක මධ්‍යයේ අධ්‍යාපන කටයුතු සිදු  කරගෙන යාමට අප රතනජෝති හිමියෝ සමත් වූහ.

කෙසේ වුව ද 1986 වර්ෂය වනවිට සිරි ධම්මාරාම විහාරාධිපති ව වැඩ සිටි අතිගරු කනන්විල තේජෝසාර නායක ස්වාමින් වහන්සේට දැඩි ලෙස ගිලන් ව හෘදයාබාධයක් ද වැළඳී වරින් වර ශ්‍රී ජයවර්ධනපුර රෝහලේත් කොළඹ මහ රෝහලේ හෘද රෝග අංශයේත් මාස ගණන් රෝහල්ගත කරන්නට වූ බැවින් උන්වහන්සේගේ සියලු ම කටයුතු සොයා බැලීම සහ විහාරස්ථානයේ සියලු ආගමික කටයුතු ඉටු කිරීම තම අධ්‍යාපන කටයුතු කරගෙනයාම ආදි ඉතා ම අවිවේකී කාර්ය බහුල කාලපරිච්ඡේදයක කටයුතු කිරීමට රතනජෝති හිමියන්ට සිදු විය.



උදෑසන 4 ට අවදිව ලුණු කැඳ සාදාගෙන රෝහලට වැඩම කොට ගුරු දේවයන් වහන්සේට හීල් දානය සහ කැඳ පිළිගන්වා නැවත විහාරස්ථානයට වැඩම කොට විහාර මළු ඇමද උදෑසන දානමය කටයුතු ද නිම කර ඉදිවෙමින් පවතින ගොඩනැගිලිවල කටයුතු ද සොයා බලමින් පිරිවෙන් පොත්වල වැඩ කටයුතු ද නිම කර දහවල නැවත රෝහලට දානමාන සපයා රෝගී ගරු ස්වාමින් වහන්සේ ළඟ උපස්ථායකයෙකු ද නවතා පිරිවෙනට වැඩම කිරීමටත් සවස පිරිවෙන් නිමා කර රෝහලට ගොස් සුව දුක් සොයා බලා නැවත පන්සලට වඩින විට රාත්‍රී 8 පමණ වී තිබේ. එහෙත් මෙම කටයුතු මහත් කරදරයක් වශයෙන් නො සැලකූ රතනජෝති හිමියෝ ''**යො ගිලානං උපට්ඨෙය්‍ය සො මං උපට්ඨෙය්‍ය**'' යන බුදුවදන අනුව යමෙක් ගිලනුන්ට උපස්ථාන කරන්නේ නම් එය බුද්ධ උපස්ථානයක් යැයි බව තේරුම් ගෙන තමාගේ ම පියාට කරන උපස්ථානයක් සේ තම ආචාර්යන් වහන්සේට කළ යුතු සියලු උපස්ථාන ඉතා ම ආදරයෙන් හා ශාසන ගෞරවයෙන් කිරීමට යුහුසුළු වූහ.

ඇතැම් අවස්ථාවල ලොකු ස්වාමින් වහන්සේ මාසය දෙක බැගින් රෝහල්ගත වී සිටි අතර ඒ සෑම අවස්ථාවක ම තම ගුරුවරයා වෙනුවෙන් හා විහාරස්ථානයේ දායක පිරිස වෙනුවෙන් උන්වහන්සේ තම යුතුකම් කොටස ඉතා ඉහළින් ඉටු කළ බව ගරු රතනජෝති ස්වාමින් වහන්සේ ඉතා නිහතමානීව පවසන්නේ තමාගේ යුතුකම් මනාව ඉටු කිරීමෙන් තමාගේ සිත තුළ ඇති වන්නා වූ අමන්දානන්දයෙනි.

## විහාරාධිපති ධුරයට පත්වීම

1991 වර්ෂයේ දී අතිගරු කනන්විල තේජෝසාර නායක ස්වාමින් වහන්සේ හෘදයාබාධය උත්සන්න වීමෙන් අපවත් වී වදාළ බැවින් ඒ වන විට වැඩ සිටි එකම පැවිදි ශිෂ්‍යයා වූ ගරු බෝගම්බර රතනජෝති අප ස්වාමින් වහන්සේට විහාරාධිපති තනතුර භාර ගැනීමට සිදුවිය. එහෙත් එය ආභරණයක් කර නොගත් රතනජෝති හිමියෝ තම ආචාර්යයන් වහන්සේ අනුගමනය කළ මග ගමන් කරමින් ''**අණුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවි**'' එනම් කුඩා වරදෙහි පවා බිය දකින සුළු ව බුද්ධාවවාදය සාථිකත්වයෙන් නොගනිමින්, එනම් ශාසනය ලිහිල් කොට නො සලකමින් කටයුතු කිරීමට මහත් වූ ප්‍රයත්නයක් දැරූ හ.  එතැන් පටන් අද

දක්වා වසර විසි තුනක කාලයක් තම ආධිපත්‍ය කාලය තුළ නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානය වර්තමාන දියුණුව දක්වා ගෙන ඒමේ පුරෝගාමී මෙහෙවරක නිරත වූයේ අප ගෞරවනීය බෝගම්බර රතනජෝති ස්වාමීන් වහන්සේ ය.

## දෙමහල් ධර්ම මන්දිරය

හිටපු විහාරාධිපති අතිගරු කනන්විල තේජෝසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන් එවකට සිටි දායක සභාව මගින් ආරම්භ කර තිබුණු ධර්ම මන්දිරය දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදි කර ඉහළ මාලය අලංකාර බිතු සිතුවම්වලින් යුත් විහාර මන්දිරයක් ලෙස ද පහත මාළය විශාල පිරිසකට ඉඩ පහසුකම් සහිත ධර්ම ශාලාවක් ලෙස ද නිර්මාණය කර 1996 අගෝස්තු 21 දින අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන් වහන්සේ ඇතුලු ගිහි පැවිදි විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් විවෘත කරන ලදි.

## තෙමහල් දහම් පාසල් ශාලාව

දහම් පාසල් දූවාදරුවන්ගේ දහම් අධ්‍යාපන කටයුතු සඳහා ඒ වන විට ඉදිකර තිබූ ශාලාව වැසි ජලයට යට වීම නිසා දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සව අවස්ථාවකදී අප නායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම පරිදි වර්තමාන අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය අප දායක සභාවේ වත්මන් සභාපති මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමාගේ අනුග්‍රහයෙන් තෙමහහල් දහම් පාසල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ආරම්භ කරන ලදි.

1994 වසරේදී මුල් ගල් තබා එහි බිම් මහලේ ඉදි කිරීම් කටයුතු ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමාගේ ධන පරිත්‍යාගයෙන් නිම කළ අතර දායක සභාවේ සභාපතිවරයෙකු ලෙස වසර කිහිපයක් සේවය කළ අයි. ඩී. එම්. ආයතනයේ සභාපති බන්ධු රණසිංහ මැතිතුමාගේ අනුග්‍රහයෙන් පළමු මහලේ ඉදිකිරීම් නිම කරන ලදි. දහම් පාසල් අරමුදල් සහ ගුවන් පාලම ඉදිකිරීම වෙනුවෙන් රජයට පවරා ගන්නා ලද විහාර වන්දි මුදල් යොදවා අප විහාරාධිපති ගරු ස්වාමීන් වහන්සේ ඉතිරි



කටයුතු නිමකරවා තෙමහල් දහම් පාසල් ගොඩනැගිල්ල සකස් කරන ලදි. 2010.10.22 දින ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ශ්‍රීමතාණන් අතින් තෙමහල් දහම් පාසල් ශාලාව විවෘත කරන ලද්දේ දසදහසක් දහම්පාසල් දරුවන්ට දහම් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදා කරමිනි.

## දෙමහල් සංඝාවාසය

අපවත් වී වදාළ ගරු විහාරාධිපති අතිපූජ්‍ය කනන්විල තේජෝසාර නායක ස්වාමීන් වහන්සේ සහ දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිපති අතිගරු නාරම්පනාවේ පඤ්ඤාරංසි අනුනායක ස්වාමීන් වහන්සේගේ උපදෙස් පරිදි එවකට පැවති සිරි පවර ගුණානුස්මරණ සමිතිය මගින් ඉදිකර තිබුණු ආවාස මන්දිරය දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස වඩාත් වැඩි ස්වාමීන් වහන්සේලා පිරිසකට වැඩ සිටීමට ආවාස පහසුකම් සහ පහත මහළ දාන ශාලාවකින් ද යුතුව ඉදි කරවා 2005 වර්ෂයේ දී විවෘත කර සඟසතු කරන ලද්දේ අප වත්මන් විහාරාධිපති ගරු නායක ස්වාමීන් වහන්සේගේ කැපවීම සහ අනුශාසනා පරිදි ය.

## දහම් පාසල් පුස්තකාලය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත ගොඩනැගිල්ල

අප විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි උන්වහන්සේ කුඩා කළ සිට ම සමීපතමව ඇසුරු කළ දායක මහත්මයකු වන ව්‍යාපාරික නිපුණ සුහසිංහ මහතා විසින් විහාරස්ථානයෙහි ආගමික වතාවත් සඳහා සහභාගි වන පින්වතුන් සහ දහම් පාසල් දරුවන් වෙනුවෙන් වඩාත් පහසුකම් සහිත සනීපාරක්ෂක පද්ධතියක් ද දහම් පාසල් පුස්තකාල ගොඩනැගිල්ලක් ද සහිත ගොඩනැගිල්ල ඉදි කරවා 2005 වර්ෂයේ දී සඟසතු කර පූජා කරන ලදි.

## දෙමහල් බෝධි ප්‍රාකාරය සහ වළාකුළු බැම්ම

වත්මන් රජයේ නුගේගොඩ නගර නිර්මාණ ව්‍යාපෘතියට අනුව නව ගුවන් පාලම ඉදි කිරීම සඳහා අප විහාරස්ථානයෙන් ද කොටසක්

රජයට පවරා ගැනීමට සූදානම් වූ අවස්ථාවේ රටේ සංවර්ධනයට සැම විට ම සහාය වීමට කැප වූ සිත් ඇති අප රතනජොති ස්වාමීන් වහන්සේ මෙහි ඇති යහපත පිළිබඳ ව දායක පිරිස දැනුවත් කරමින් ඉදිරිපත් වූ විරෝධතාවන් සමනය කර ඒ සඳහා පූර්ණ සහාය ලබා දුන්හ.

දිගු කලක පටන් ම උන්වහන්සේගේ සිත තුළ තිබුණු බලාපොරොත්තුවක් සපුරා ගනිමින් රජයෙන් ඉඩම සඳහා ලැබුණු වන්දි මුදල යොදවා ඉතා අලංකාර සහ කලාත්මක දෙමහල් බෝධිප්‍රාකාරයක් ඉදි කරවීමට කටයුතු කරන ලදි. උන්වහන්සේට ඉතා හිතවත් නිමල් ලොකුලියන ඉංජිනේරු මහතාගේ උපදෙස් නිරතුරුව ලබා ගනිමින් නුගේගොඩ නගරයට මහත් අලංකාරයක් සපයමින් අප විහාරස්ථානයට නව එළියක් ඇති කළ නව දෙමහල් බෝධි ප්‍රාකාරය සහ අලංකාර වළාකුළු බැම්ම නිර්මාණය කර 2010.10.22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සුරතින් විවෘත කරන ලදි. මෙම ඉදිකිරීම වෙනුවෙන් නිරතුරුව අපමණ වෙහෙසක් ගෙන ක්‍රියා කිරීමට උන්වහන්සේට සිදු විය. විශේෂයෙන් ම වළාකුළු බැම්ම උන්වහන්සේගේ ම නිර්මාණයකි. නොයෙකුත් ඈත ප්‍රදේශවලට වැඩම කරමින් සිතට ලබා ගත් නිර්මාණ ඇසුරින් උන්වහන්සේ මෙම නව නිර්මාණාත්මක ප්‍රාකාරය ඉදිකිරීමට කටයුතු කළේ ය.

මේ සමග දායක සභාවේ උප සභාපති පියදාස විතානගේ මැතිතුමා සාංචි තොරණ ඉදිකිරීමේ වගකීම භාරගත් අතර අප නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා ඇතිව එය ද ඉතා අලංකාරව නිර්මාණය කර 2010 ඔක්තෝබර් 10 දින විවෘත කරන ලදි.

දායකසභාවේ හිටපු සභාපති එන්. ඒ. ධර්මබන්ධු මැතිතුමා සහ එම මැතිණිය විසින් තම මියගිය දරුවන් සිහි කර ඉදි කර තිබුණු නව පිළිමගෙය නගර නිර්මාණය හේතුවෙන් ඉවත් කිරීමට සිදු වූ අතර එකී පිළිමවහන්සේ නව දෙමහල් බෝමළුවේ පාරට මුහුණලා තැන්පත් කර ඇත.



## පැරණි විහාර මන්දිරය

1951 වර්ෂයේ ව්‍යාපාරික සත් ගුණවත් එම්.එස් පෙරේරා මැතිතුමා විසින් සිය ධන පරිත්‍යාගයෙන් ඉදිකර තිබූ විහාර මන්දිරයේ කොටසක් මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් ඉවත් කිරීමට සිදු වූ අතර ගරු නායක ස්වාමීන් වහන්සේගේ උපදෙස් පරිදි එම ගොඩනැගිල්ල පමණක් ඉවත් කර පිළිම වහන්සේට නව ආවරණයක් මොහාන්ලාල් ග්‍රේරු මැතිතුමාගේ අනුග්‍රහයෙන් ඉදිකරවන ලදි.

## ශ්‍රී සුචරිත වර්ධන දහම් පාසල

1951 වර්ෂයේ විහාරස්ථානයෙහි ආදි කර්තෘ බෝවල සිරිපවර ස්වාමිපාදයන් වහන්සේගේ අනුශාසනා පරිදි ආරම්භ කරන ලද ශ්‍රී සුචරිත වර්ධන දහම් පාසල මේ රටට විශාල ගුණවත් දරු පිරිසක් බිහිකළ ආයතනයකි.

වසර දහයක පමණ සිට මෙම දහම් පාසල විහාරස්ථ ස්වාමීන් වහන්සේලාගේ පාලනයෙන් ගිලිහී වෙන ම ආයතනයක් වශයෙන් පවත්වාගෙන යනු දුටු අප රතනජෝති ස්වාමීන් වහන්සේ දැඩි තීන්දුවක සිට නව කළමණාකරණයක් යටතේ විහාරස්ථානය හා බද්ධ වූ විධිමත් ඵලදායී දහම් පාසලක් බවට පත් කිරීම සඳහා නොයෙක් අභියෝග මධ්‍යයේ කටයුතු කළ අතර මේ වනවිට සිසුන් දෙදහසකට නො අඩු පිරිසක් ඉගෙනුම ලබන ඉංග්‍රීසි සිංහල ද්විභාෂාවෙන් ම අධ්‍යාපනය සිදු කරන ආයතනයක් බවට පත් කිරීමට උන්වහන්සේට හැකි වී තිබේ.

2011 වර්ෂයේ අයි.ඩී. එම්. ආයතන සභාපති බන්ධු රණසිංහ මහතාගේ අනුග්‍රහය ඇතිව දරුවන් සඳහා නොමිලේ පරිගණක පාඨමාලාවන් ඇති කිරීමට ද දහම් පාසලේ ආදි ශිෂ්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ අනුග්‍රහයෙන් දහම් පාසල් පුස්තකාලයක් ද ආරම්භ කර මේ දක්වා පවත්වාගෙන එනු ලබන්නේ අප නායක ස්වාමීන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය නිසා ය.

## ඉංග්‍රීසි මාධ්‍ය දහම් පාසල

ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට දහම් අධ්‍යාපනය සිංහල මාධ්‍යයෙන් හැදෑරීමට ඇති අපහසුතාවයත් එම දරුවන් දහම පැත්තට යොමු කොට සුමගට ගැනීමටත් අප නායක ස්වාමින් වහන්සේ තුළ තිබුණු බලාපොරොත්තුව පිළිබඳ ලයිසියම් ආයතනයේ නිර්මාතෘ මොහාන්ලාල් ග්‍රේරු මැතිතුමා සමග සාකච්ඡා කිරීමෙන් පසු 2005 ජුනි 05 වන දින කුමාරි ග්‍රේරු මැතිනියගේ ප්‍රධානත්වයෙන් ඉංග්‍රීසි මාධ්‍ය දහම් පාසල ඇති කළ අතර මේ වන විට විශාල සිසු පිරිසක් ඉගෙනුම ලබන ප්‍රදේශයේ ජනප්‍රිය දහම් පාසලක් බවට පත්ව තිබේ. 2015 වර්ෂය වන විට එම දහම් පාසල සිය 10 වන සංවත්සරය සැමරීමට සූදානමින් සිටියි.

පොත පතේ දැනුමට වඩා ගුණ දහමට හා බෞද්ධ වත පිළිවෙතට මුල් තැන දෙන වැඩ සටහන් රාශියකින් යුතුව ගුණවත් දරු කැළක් දැයට දායාද කිරීමේ අරමුණෙන් මෙම දහම් පාසල ක්‍රියාත්මක කෙරේ.

නිර්මාණශීලී සංවේදී දරු පිරිසක් බිහි කිරීමට කලාවේ උපයෝගිතාව පිළිබඳ සිතූ අප නායක ස්වාමින් වහන්සේ වාර්ෂිකව කලා උළෙලක් සංවිධානය කළ අතර මේ වන විට සිරිදම් කලා කවය නමින් සංගමයක් ද ආරම්භ කර විධිමත් වැඩ සටහනක් යටතේ දරුවන්ගේ කලා කුසලතාවන් එළි දැක්වීමට කටයුතු කර ඇත. විශාල සිසු පිරිසක් මේ වන විට සිරිදම් කලාකවය හා සම්බන්ධ වී තිබේ.

## සංඝ සභාවේ තනතුරු

බෝගම්ගර රතනජෝති අප නායක ස්වාමින් වහන්සේ 1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා අමරපුර ස්වේජින් නිකායේ කර්මවාගාචාර්ය තනතුරට සහ කාරක සංඝ සභාවේ සාමාජිකත්වයට පත්කර ගන්නා ලද අතර සෑම වර්ෂයක දී ම පවත්වනු ලබන නිකායේ වාර්ෂික උපසම්පදා විනය කර්මය ඇතුළු විනය කර්ම අවස්ථාවල දී සිය ශාසනික දායකත්වය නිකායේ අභිවෘද්ධිය සඳහා ලබා දෙමින් සිටියි. කොළඹ දිසාවේ ප්‍රධාන



සංඝනායක තනතුර සහ **සිරිධම්මවංසාලංකාරසාසනජෝති** යන ගෞරව නාමය උන්වහන්සේ වෙත තත් නිකායික සංඝ සභාව මගින් පිරි නමන ලද්දේ උන්වහන්සේගේ සේවාව ඇගයීමක් වශයෙනි. ශ්‍රී ලංකා අමරපුර ස්වේජින් නිකායේ සියලු කටයුතුවලට සිය පූර්ණ දායකත්වය ලබා දෙමින් අප ස්වාමින් වහන්සේ කටයුතු කරති.

## ගුරු සේවය

1991 විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිම කළ අප නායක ස්වාමින් වහන්සේට 1991 දෙමටගොඩ මහා විසුද්ධාරාම පිරිවෙණෙහි ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා පත්වීමක් ලැබුණි. එහි වසර දෙකක පමණ කාලයක් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වගකීම රතනජෝති හිමියන්ට පැවරුණි. ඇක්වයිනාස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව ද සමත් ව සිටි අප ස්වාමින් වහන්සේ 1991 සිට 1993 දක්වා පිරිවෙනෙහි ඉගැන්වූ දෙවර්ෂය තුළ පිරිවෙන් අවසාන විභාගයට ඉදිරිපත් වූ සෑම සිසුවෙක් ම ඉංග්‍රීසි විෂයෙන් සමත් කරවීමට උන්වහන්සේට හැකි විය.

මේ අතර රජයේ පැසල්වලට ඉංග්‍රීසි ගුරුවරුන් තෝරා ගැනීම සඳහා ඩෙලික් පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමේ පරික්ෂණයෙන් ද අප නායක ස්වාමින් වහන්සේ සමත් වූ අතර සිය විශ්ව විද්‍යාල අධ්‍යාපනය සහ ගෞරවනීය නායක ස්වාමින් වහන්සේ ගිලන්ව වැඩ සිටි බැවින් විහාරස්ථානයෙන් බැහැරට වැඩම කරවීමට තිබූ අකමැත්ත මත එම පාඨමාලාව අතහැර දැමීමට අප නායක ස්වාමින් වහන්සේ තීරණය කළහ.

1993 ජනවාරි 11 දින රජය මගින් ලබාදෙන ලද උපාධි ගුරු පත්වීමක් ලැබූ අප රතනජෝති ස්වාමින් වහන්සේ මොරටුව පල්ලියගොඩැල්ල බෞද්ධ විද්‍යාලයට සිය මුල් ම පත්වීම ලබා එහි මාසයක පමණ කාලයක් සේවය කර ඉන් පසු ගමනාගමන අපහසුතා මත දෙහිවල ශාන්ත මරියා විදුහලට මාරුව ලබා ගන්නා ලදි. 1993 සිට 1999 දක්වා වසර හයක කාලයක් එම විදුහලේ දරුවන්ට සිංහල, බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම පමණක් නොව දරුවන් ඉතා විනයානුකූල පිරිසක් බවට

පත් කිරීමට අවශ්‍ය ආගමික හා වෙනත් වැඩ සටහන් සිදු කරමින් තම සේවය එම පාසලට උපරිමයෙන් ලබා දීමට කටයුතු කළේය.

දිගු කලක් එකම තැන සේවය කිරීමට උන්වහන්සේ තුළ ඇති අකමැත්ත මත එම පාසලෙන් ස්ථාන මාරුවක් ලබා ගංගොඩවිල ශ්‍රී රේවත රාජකීය විද්‍යාලයට වැඩම කළහ. එම විද්‍යාලයේ වසර 8 කාලයක් සේවය කළහ. එම පාසලේ ද තම ගෞරවය රැක ගනිමින් ගුණගරුක දැන උගත් දරු පිරිසක් බිහි කිරීමට තම කාලය කැප කරමින් සේවය කළහ.

2007 සිට වසරක කාලයක් නුගේගොඩ ශාන්තජෝන් විද්‍යාලයට වැඩම කළ උන්වහන්සේ එහි සහකාර විදුහල්පති වශයෙන් හා අංශ ප්‍රධාන වශයෙන් ද වටිනා සේවයක් සිදු කළ අතර 2008 වසරේ දී ගුරු උපදේශක විභාගයෙන් ලැබූ සාමර්ථය මත ගුරු උපදේශක තනතුරට පත් ව මේ වන විට පිළියන්දල අධ්‍යාපන කලාපයේ වසර 6 ක කාලයක සිට සේවය කරමින් සිටිති.

## සමාජ සහ සාසනික සත්කාර

අප රතනජෝති නායක ස්වාමීන් වහන්සේගේ උපන් ගම මාතලේ කයිකාවල බෝගම්බරයි. පැවිදි වීමට තමාට මුල් අඩිතාලම වැටුණේ ගමේ පන්සල නිස යි. ඒ අනුව උන්වහන්සේට තම ගමට යම් සේවයක් කිරීමට තිබූ දැඩි අභිලාසය අනුව සිය දායක පිරිස ද සම්බන්ධ කරගෙන අබලන්ව පැවති පැරණි ධර්මශාලාව වෙනුවට නව ධර්ම ශාලාවක් ඉදි කරවූහ. 2012 වර්ෂයේ ගමේ විහාරස්ථානයෙහි කඨින පිංකමේ මූලික දායකත්වය සිය මව්පියන් විසින් භාරගෙන තිබූ අතර එම කඨින පින්කම් මාලාවට සමගාමීව නව ධර්ම ශාලා ගොඩනැගිල්ල විවෘත කොට පූජා කරන ලදි. මේ වන විට එම ප්‍රදේශයේ බොහෝ ආගමික සාමාජික වැඩ සටහන් පැවැත්වෙන්නේ එම ගොඩනැගිල්ල තුළ යි.

ගම ආරක්ෂා වන්නේ ගමේ විහාරස්ථානය ආරක්ෂා වූ විට යි. විහාරස්ථානය ආරක්ෂා වන්නේ ස්වාමීන් වහන්සේලා වැඩ සිටි විට යි. එබැවින් අප නායක ස්වාමීන් වහන්සේ ගමේ විහාරස්ථානයෙහි ස්වාමීන් වහන්සේලාගේ අභිවෘද්ධිය වෙනුවෙන් සැම විටම කටයුතු කරයි.



ගමේ දුවාදරුවන් ගුණගරුක පිරිසක් කිරීම සඳහා දහම් පාසලට ගෙන්වා ගැනීමටත් ගමේ පන්සලේ දහම් පාසල සංවර්ධනය කිරීමටත් කැපවී සිටින අප රතනජෝති ස්වාමීන් වහන්සේ දහම් පාසල් පැමිණෙන දරුවන් සඳහා සැම වසරක ම තම උපන් දිනට සමගාමීව නිල ඇඳුම් සඳහා සුදු රෙදි සහ අභ්‍යාස පොත් ලබා දෙමින් වසර කිහිපයක සිට විශාල සමාජ සත්කාරයක නිරතව සිටියි. දහම් පාසල සඳහා ඩෙස් බංකු ලබා දීම ද එවැනි ම සමාජ සත්කාරයකි. ස්වේච්ඡාවෙන් සේවය කරන ගුරු භවතුන් සඳහා වාර්ෂිකව නිල ඇඳුම් ලබා දීමට ද උන්වහන්සේ අමතක නොකළහ.

නුගේගොඩ සිරි ධම්මාරාම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් වාර්ෂික ව දිළිඳු පවුල්වල දරුවන් උදෙසා ශිෂ්‍යත්ව පිරිනැමීම, මරණයට නියම වූ ගවයන් නිදහස් කිරීමේ පින්කම් වාර්ෂිකව සිදු කිරීම, දිළිඳු පවුල් සඳහා වියළි ආහාර බෙදා දීම ආදී ප්‍රජා සත්කාර රාශියක් ද අප නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් වාර්ෂිකව සිදු කරනු ලබයි.

අපවත් වී වදාළ ආදි කර්තෘන් වහන්සේලා සහ විහාර භූමිය පූජා කළ ජොහානා පීරිස් සෙනෙවිරත්න මැතිනිය ඇතුළු සතර පේරුවේ මියගිය සියලු දායක පිරිස හා හිතවත් පිරිස සිහි කරමින් අප නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් වාර්ෂිකව ගුණ සමරු පිංකම් මාලාවක් ද අප විහාරස්ථානයෙහි සිදු කරනු ලබයි.

## සම්බුදු තෙමඟුල් පෙරහැර

ඉතා දිගු කලක පටන් වෙසක් පොහෝ දිනයට නුගේගොඩ නගරය අනෙකුත් නගරයන්ට සාපේක්ෂව ඉතා අඳුරු ස්වභාවයකින් පවතින බව දුටු අප රතනජෝති නාහිමියන් ප්‍රාදේශයේ සියලු ම පාසල් සමග ඒකාබද්ධව තම විහාරස්ථ දහම් පාසලේ සංවිධායකත්වයෙන් 2006 වසරේ සිට සැම වර්ෂයක ම ඉතා අලංකාර නැටුම් ගැයුම්වලින් සමලංකෘත දර්ශනීය පෙරහැරක් පවත්වාගෙන එනු ලබයි. ප්‍රදේශයේ අඳුරුබව දුරු කරලීමටත් බොදු දනන්ගේ සිත් තුළ ශ්‍රද්ධාව ජනිත කිරීමටත් එයින් මහත් පිටිවහලක් ලැබී ඇත. 2014 වර්ෂය වනවිට මෙම

වැඩ සටහන වඩාත් පුළුල් කරමින් නුගේගොඩ ව්‍යාපාරික සහ වෘත්තිකයින්ගේ එකමුතුවේ ද සහයෝගය ලබා ගනිමින් අලි ඇතුන් සහිත අලංකාර නර්තන අංග රාශියකින් ම සමන්විතව එය ඉතා දර්ශනීය පෙරහැරක් බවට පත් කල අතර ප්‍රදේශයේ බොහෝ දෙනෙකුගේ ප්‍රශංසාවට ද එය ලක් වූ කරුණක් විය. ඉදිරියටත් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ අභිලාෂය උන්වහන්සේ තුළ පවතියි.

## නුගේගොඩ ව්‍යාපාරික සහ වෘත්තිකයින්ගේ එකමුතුව

නුගේගොඩ නගරයේ පවත්නා යම් යම් ගැටළු නිරාකරණය කර ගැනීම වෙනුවෙන් නුගේගොඩ ප්‍රදේශයේ ප්‍රබල සංවිධානයක අවශ්‍යතාව දිගු කලක පටන් අවබෝධ කරගෙන සිටි අප ස්වාමීන් වහන්සේ නුගේගොඩ ව්‍යාපාරික භවතුන් සමගත්. සිය දායක පිරිස සමගත් වරින් වර මේ පිළිබඳ සාකච්ඡා කරන ලදි. දීර්ඝ සාකච්ඡා වට කිහිපයක ප්‍රතිඵලයක් ලෙස නුගේගොඩ ව්‍යාපාරික ප්‍රජාව සමග නොයෙකුත් වෘත්තීන්ට අයත් පිරිස ද සම්බන්ධ කරගෙන පුළුල් සංවිධානයක් ඇති කිරීමට එකඟතාව ඇති කරගෙන 2010 ඔක්තෝබර් මස 22 වන දින සිරි ධම්මාරාම විහාරස්ථානයට සැපත් වූ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ අතින් නුගේගොඩ සුප්‍රසිද්ධ ව්‍යාපාරික දෙපළක් වන සවිසිරි ව්‍යාපාර අධිපති පී. ලොකු කොඩිකාර මැතිතුමන්ට හා සරසවි පොත් ප්‍රකාශනාධිපති එච්. ඩී. ප්‍රේමසිරි මැතිතුමාටත් ප්‍රථම සාමාජිකත්වය පිරිනැමීමෙන් පසු සංකේතාත්මකව නුගේගොඩ ව්‍යාපාරික සහ වෘත්තිකයින්ගේ එකමුතුවේ ආරම්භය සිදු විය.

මේ වන විට වසර හතරක් ඉක්මවා ඇති මෙම සංගමය පුළුල් සංවිධානයක් ලෙස ප්‍රදේශයට විශාල සේවයක් සපයමින් ව්‍යාපාරික හා වෘත්තික සාමාජික පිරිස 150 ඉක්මවා වර්ධනය වී ඇත. 2014 ''ශ්‍රද්ධා'' නමින් වෙසක් කලාපයක් පවත්වමින් නුගේගොඩ නගරයට විශේෂ අලංකාරයක් ලබාදීමටත් වසර 4 ක කාලය තුළ නුගේගොඩ නගරයේ වෙසක් සැරසිලි සහ විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් කටයුතු කරනු ලබන්නේ අප නායක ස්වාමීන් වහන්සේගේ සංකල්පයක් මත හා



උන්වහන්සේගේ ප්‍රධාන අනුශාසකත්වය ඇතිව ක්‍රියාත්මක වන එම ව්‍යාපාරික හා වෘත්තික එකමුතුව යි.

## සිරි ධම්මාරාම දායක සභාව

විහාරස්ථානයෙහි ආරම්භක වකවානුවෙහි සිට ම ක්‍රියාත්මක වන සිරි ධම්මාරාම දායක සභාව විහාරස්ථානයෙහි සියලුම ආගමික සාමාජික කාර්යයන්හි දී සහ සංවර්ධන කටයුතුවල දී ප්‍රමුඛ දායකත්වය ලබා දෙමින් ප්‍රබල ශක්තියක් ලබා දෙයි. අප නායක ස්වාමීන් වහන්සේ විසින් විහාරස්ථානය තුළ ක්‍රියාත්මක කරන ලද සියලු සංවර්ධන කටයුතු සඳහා දායක සභාවේ නිලධාරී මණ්ඩලය ඇතුළු සාමාජික පිරිස ලබාදෙන සහයෝගය අප නායක ස්වාමීන් වහන්සේ නිතර සිහිපත් කරති.

දායක සභාවේ වත්මන් සභාපතිතුමා මොහාන්ලාල් ග්‍රේරු මැතිතුමා වන අතර එතුමන් විසින් හා ලයිසියම් ආයතනය මගින් විහාරස්ථානයෙහි සියලු ආගමික, ශාසනික කටයුතු සඳහා විශාල අනුග්‍රහයක් සහ ශක්තියක් ලබා දෙන්නේ විහාරස්ථානයෙහි කටයුතු ද තම ජීවිතයේ එක් කාර්යයක් ලෙස සලකමිනි. මෙය ද අප නායක ස්වාමීන් වහන්සේ ලද භාග්‍යයක් ලෙස සිතිය හැකිය.

## බොදු වනිතා සංවිධානය

විහාරස්ථානයෙහි සිදු කරනු ලබන ආගමික, ශාසනික හා සාමාජය සේවාවන් සඳහා විශාල දායකත්වයක් ලබා දෙන්නේ කාන්තා පක්ෂය යි. එකී සියලු වැඩ සටහන් වඩාත් විධිමත්ව සහ ක්‍රමානුකූලව සිදු කර ගැනීමට කාන්තා සංවිධානයක අවශ්‍යතාව අවබෝධ කරගත් අප නායක ස්වාමීන් වහන්සේ 2013 වර්ෂයේ දී විහාරස්ථානයට සම්බන්ධ දායිකාවන් සම්බන්ධ කරගෙන බොදුවනිතා සංවිධානය නමින් කාන්තා සංවිධානයක් ආරම්භ කරන ලදි. තේජා විතානගේ මැතිණියගේ සභාපතිත්වයෙන් පවතින මෙම සංවිධානය අප නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි මෙම වසර එක හමාරක පමණ කාලය තුළ එම සංවිධානය ද ඉතා ප්‍රබල සංවිධානයක මට්ටමට පැමිණ ඇති අතර විශාල ආගමික හා සාමාජික සත්කාර රැසක් ද සිදු කර ඇත.

## දහම් පාසල් සංවර්ධන සමිතිය

දහම් පාසල් දරුවන්ගේ ගුණ නැණ වැඩීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සියලු වැඩ සටහන් සඳහා ගුරු මණ්ඩලයට විශාල ශක්තියක් ලබා දෙමින් දහම් පාසල් සංවර්ධන සමිතිය ක්‍රියාත්මක වන අතර විශේෂයෙන් එහි කාරක සභික පිරිස දහම් පාසලේ එදිනෙදා කටයුතු ඉතා සාර්ථක හා ඵලදායී කර ගැනීමට සිය කාලය, ශ්‍රමය සහ ධනය කැප කරමින් ලබාදෙන සහාය අප නායක ස්වාමීන් වහන්සේ සිදුකරන ශාසනික සේවයට මහත් ශක්තියකි. ඉංග්‍රීසි, සිංහල මාධ්‍ය දෙකින් ම ක්‍රියාත්මක දහම් පාසල් දෙකෙහි ම මෙම සංවර්ධන සමිති ක්‍රියාත්මක වෙයි. අතර මෙම සමිතියේ දහම් පාසල් දරුවන්ගේ ප්‍රත්‍යය පහසුව සඳහා අවශ්‍ය අනුග්‍රාහකත්වය සපයන අතර දහම් පාසල භෞතික වශයෙන් සංවර්ධනය කිරීමටත් දරුවන්ගේ ආධ්‍යාත්මික ගුණවගාව වෙනුවෙන් කළ යුතු විවිධ ආගමික කටයුතුවලදීත් පුරෝගාමී සේවයක් ලබා දෙයි.

## නාහිමියන් කරනු ලබන සිහිපත් කිරීම්

තම දිවි ගමනේ මේ තාක් දුර පැමිණීමට ශක්තිය ලබාදුන් සියළු දෙනාට ම අප බෝගම්බර රතනජෝති ස්වාමීන් වහන්සේ තම කෘතවේදීත්වය පළ කරති.

තම ජීවිත අභිමතාර්ථයක් වූ පැවිදි බව ලබාගැනීම සඳහා අකමැත්තෙන් වුව ද තමාව සසුනට පූජා කළ සහ ලේ කිරි කර පොවා දහඩිය කඳුළු වගුරුවා තමාව ඉතා ආදරයෙන් හා සෙනෙහසින් රැකබලා ගත් දිවිමගේ පැමිණි අපමණ බාධක කම්කටොලු දුක් ගැහැට හමුවේ නොසැලී සිටීමටත් ඉදිරිය දැකීමටත් ශක්තිය සැපයූ හා මග පෙන්වූ සදාදරණීය පියාණන්ටත් මෑණියන්ටත් ණය ගැති බව උන්වහන්සේ සිහිපත් කරති. එමතු ද නොව තමාව පන්සලට නිතර කැඳවාගෙන ගිය බණ දහම කියාදුන් තම මිත්තණියට උන්වහන්සේ නිතර පුණ්‍යානුමෝදනා කරති. සහෝදර බැම්මෙන් එකට බැඳී එදා මෙදාතුර තමා අත්නොහැර සියලු ශක්තීන් ලබා දෙමින් සිටින සොයුරු සොයුරියන් හා උන්වහන්සේ හදින් බැඳී සිටියි.



ගමේ විහාරස්ථානය සහ එහි එවකට වැඩසිටි ගරුතර නායක ස්වාමීන් වහන්සේලාගෙන් ලැබුණු ආගමික ආශිර්වාදය අප නායක ස්වාමීන් වහන්සේ නිතර සිහිපත් කරති.

පාසල් දිවියේ අකුරු කර වූ හා තම විභව ශක්තිය මතුකර ගැනීමට මග හසර කියාදුන් ඇදුරුතුමන්ලා හා තුමියන්ලාට ද උන්වහන්සේගේ කෘතවේදී පුණ්‍යානුමෝදනය හිමි වේ.

නුගේගොඩ සිරිධම්මාරාම විහාරස්ථානයට පැවිදිකම ලබා ගැනීම සඳහා සම්බන්ධ කළ විශ්‍රාමලත් විදුහල්පතිතුමෙකු වන විජේසිරි තිලකරත්න මැතිතුමා උන්වහන්සේගේ ජීවිතයේ අමතක නො වන එක් උත්තම චරිතයකි.

තමන්ව අති උත්තම ප්‍රව්‍රජ්‍යා භූමියට පත් කොට සසුන් මගේ මෙතෙක් දුර ඉදිරියට පැමිණීමට අඩිතාලම සහ සියලු ශක්තිය ලබා දෙමින් ඔවදන් දුන් පිය සෙනෙහසින් කටයුතු කළ තම ගුරු දේවයන් වහන්සේලාට අප රතනජෝති හිමියන් සදා ණය ගැතිය.

පැවිදි දිවියේ තමාට අධ්‍යාපනය ලබා දුන් දෙමටගොඩ මහා විසුද්ධාරාම පිරිවෙණෙහි හා මාළිගාකන්ද විද්‍යොදය පිරිවෙණෙහි සේවය කළ

අතිපූජ්‍ය හොරම්පැල්ලේ විනීත නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය නැහින්නේ විජිතසිරි නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය අකුරැටියේ අමරවංශ නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය කළල්ඇල්ලේ ශේඛර නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය බළන්ගොඩ සෝභිත නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය වෑගම පියරතන නායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය මුරුන්ගාගස්යායේ ඥානිස්සර නායක ස්වාමීන් වහන්සේ

අතිපූජ්‍ය බෙල්ලන්විල විමලරතන නායක ස්වාමීන් වහන්සේ

**විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ**

මහාචාර්ය සුනිල් ආරියරත්න මැතිතුමා
මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මැතිතුමා
මහාචාර්ය ධම්මික ගංගනාත් දිසානායක මැතිතුමා
යන ගිහි පැවිදි ආචාර්ය භවතුන් ඇතුළු සියලු ම ගුරු උතුමන්ට උන්වහන්සේගේ ගෞරවනීය පුණ්‍යානුමෝදනාව හිමි වේ.

නුගේගොඩ සිරිධම්මාරාම විහාරස්ථානයෙහි උන්වහන්සේ සිදුකළ සාසනික ජාතික ආගමික සේවාවන්හිදී දිගු කලක සිටම තමා අත් නොහැර සිටි සියලු දෙනා උන්වහන්සේ නිතර කෘතවේදී ව සිහිපත් කරයි අතර ඒ අතරින්,

චන්ද්‍රා සුභසිංහ මැතිනිය
මල්ලිකා පීරිස් මැතිනිය
නන්දාවතී සේරම් මැතිනිය
ප්‍රින්සි හේවාවිතාරණ මැතිනිය
අසෝකා අමරසිංහ මැතිනිය
සී. අබේනායක මැතිනිය
නිපුණ සුභසිංහ මැතිතුමා
සුජීව අත්තනායක මැතිතුමා
ඒ. එන්. ධර්මබන්ධු මැතිතුමා
මහින්ද වික්‍රමසිංහ මැතිතුමා
ෂෙල්ටන් දසනායක මැතිතුමා
නාලනී ජයසේකර මැතිනිය
එල්. ජී. එච්. සුමනසිරි (මාමා)
ආනන්ද වීරසේකර මැතිතුමා
ඉංජිනේරු නිමල් ලොකුලියන මැතිතුමා
මොහාන් ලාල්ග්‍රේරු මැතිතුමා සහ එම මැතිනිය
යන පිරිස විශේෂයෙන් හෘදයාංගම ව සිහි ගන්වති.



මෙයට අමතරව මෑත භාගයේ සිට ඉතා ම සමීපව හිතවත්කමින් ලෙන්ගතුකමින් තම සාසනික හා සාමාජික සේවයට සහාය දෙන කළණ මිතුරු විශාල දායක පිරිසක් සිටින අතර නම් වශයෙන් සඳහන් කිරීමට අපහසු හෙයින් නමින් සඳහන් නොකළත් ස්වාමීන් වහන්සේගේ හෘදයාංගම පුණ්‍යානුමෝදනාව ඒ සියලු දෙනාටම හිමි වේ.

දශක 6 කට වැඩි කලක් සම්බුදු දහම බෙදා දෙමින් ආගමික සාසනික සාමාජික සේවාවන් පවත්වාගෙන යාමට අප ගුරු නායක ස්වාමීන් වහන්සේලාට මෙබඳු රමණීය විහාරස්ථානයක් ගොඩ නැගීම සඳහා මිළ කළ නොහැකි මෙම භූමි භාගය 1950 වර්ෂයේ දී අතිපූජ්‍ය බෝවල සිරිපවර නායක ස්වාමීන් වහන්සේට පූජා කළ සත් ගුණවත් මල්ලවත්තගේ ජොහානා පීරිස් සෙනෙවිරත්න මැතිනියට මෙන් ම ආරම්භයේ සිට මේ දක්වා විහාර සංවර්ධනයේදී අතහිත දුන් සතර පේරුවේ මියගිය සියලුම දායකකාරකාදීන්ටත් පුණ්‍යානුමෝදනා කරමු.

අප නායක ස්වාමීන් වහන්සේගේ සියලු ආගමික සාමාජික සේවාවන්හි ප්‍රධාන ශක්තිය තම ශිෂ්‍ය පිරිස සහ දායක පිරිස යි. විහාරස්ථානයේ සියළු ආගමික, සාමාජික සේවාවන් සඳහා පිය සෙනෙහසින් තමාට ශක්තිය සපයන තම පැවිදි ශිෂ්‍ය බෝගම්බර මෛත්‍රීරතන බෝගම්බර අරියරතන හා හක්මන ධම්මරතන ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේලාව පිළිබඳවද අප නායක ස්වාමීන් වහන්සේ තුළ ඇත්තේ විශාල බලාපොරොත්තුවකි.

එමතුද නොව ප්‍රධාන වශයෙන් විහාරස්ථානයෙහි සියලුම කටයුතු සොයා බලමින් පිය සෙනෙහසින් විහාරවාසී සියලුම ස්වාමීන් වහන්සේලාටත් ඇප උපස්ථාන කරන විහාරස්ථානයේ සේවක සුමනසිරි මාමාට අප නායක ස්වාමීන් වහන්සේ තුළ ඇත්තේ අපමණ ගෞරවාන්විත හිතවත්කමකි.

මේ සියලු දෙනාට උන්වහන්සේ තම හෘදයාංගම ස්තුතිය හා පුණ්‍යානුමෝදනාව සිදු කරති.

සැමට තෙරුවන් සරණයි.

## ආදි කතෘන් වහන්සේලා



අතිගරු අරංගල සිරිධම්ම මහනාහිමි



අතිගරු බෝවල සිරිපවර නාහිමි
සිරි ධම්මාරාමයෙහි ආදිකතෘ





අතිගරු නාරංපනාවේ පඤ්ඤාරංසි නාහිමි



අතිගරු කනන්විල තේජෝසාර නාහිමි



**මව්පිය දෙපල**





කුඩාකල තම මවතුරුලේ



සාමණේර අවධිය



1978 වර්ෂය (පැවිදි සහෝදර පිරිස සමග)





1983 වර්ෂයේ ස්වාමින් වහන්සේ



දෙමාපිය දෙපළ සමගින් තම නිවස ඉදිරිපිට



ශාසනාලයෙන් දනුම් දීමයි

සැදැහවත් පින්වතුනි !

නුගේගොඩ සිරිධම්මාරාම විහාරස්ථානයෙහි
වැඩ වෙසෙමින් දීර්ඝ කාලයක් අපට අර්ථයෙන්
ධර්මයෙන් අනුශාසනා කළා වූ
බෝගම්බර රතනජෝති කුඩා ස්වාමීන්
වහන්සේගේ උපසම්පද මංගලෝත්සවය

1984 ජූනි මස 3 වන ඉරුදින
සවස 4 ට
දෙමටගොඩ මහා විසුද්ධාරාමයේදී සිදුකරණු ලැබේ
ඒ නිමිත්තෙකාට පවත්වනු ලබන රිය පෙරහැර
සිරි ධම්මාරාමයෙන් එදින සවස 3 ට
පිටත්වේ.

සියළු පින්වතුන් පැමිණ මෙම උසස් පිංකමට
සහභාගිවෙත්වා.

මීට,
සිරිධම්මාරාම විහාරස්ථානයේ
දායක දායිකා පිරිස

උපසම්පද මංගලෝත්සවයක්

බෝගම්බර රතනජෝති
කුඩා සවාමීන් වහන්සේ
1984 ජූනි මස 3 වන ඉරුදින
කොළඹ දෙමටගොඩ මහා විසුද්ධාරාම
ශාසන ශෝභිනී සීමා මාලකයේදී

උපසම්පදා කාඩ්පත



තම ගුරුදේවයන් වහන්සේලා සමග උපසම්පදාවට
පෙර නිළමේ ඇඳුමින් සැරසී. (මැද)



නිළමේ ඇඳුමින් තම දෙමාපිය ඥතීන් සමග





දයක සභාව සමග



දයිකාවන් සමග



උපසම්පදාව සඳහා සීමාවට වැඩම කරමින්



මංගල ධර්ම දේශනාව සඳහා වැඩමවමින්





සිය පවුලේ දෙමාපියන් ඇතුළු සහෝදර සහෝදරියන් සමග
අපේ නායක ස්වාමින් වහන්සේ



මඩිහේ පඤ්ඤාසීහ මහා නායක මාහිමිපාණන්
සමග අපේ නායක හාමුදුරුවෝ



පැරණි ධර්ම ශාලාවේදී උපසම්පදාවලබා
මංගල ධර්ම දේශනාව පවත්වමින්

45



ප්‍රින්සි හේවාවිතාරණ මැතිණියගේ නිවසේ
ධර්ම දේශනාවන් සිදු කරමින්






ශ්‍රී ජයවර්ධනපුර සරසවිය ඉදිරිපිට



පැරණි බෝමලුව ඉදිරිපිට හිටපු විහාරාධිපති
අතිගරු කනන්විල තේජෝසාර නාහිමියන් සමග 1983



ගරු කනන්විල තේජෝසාර නාහිමි, ගරු ගෙලිඔය නාහිමි,
ගරු කරපුටුගල පඤ්ඤාසේකර හිමි සහ
නිපුන සුභසිංහ, කනිෂ්ක සිල්වා දායක දෙපල සමග 1982





විහාරයට මුල්ගල් තැබීමට ආරාධිත අමුත්තන්
පැරණි සිරිපවර මාවත ඔස්සේ කැඳවාගෙන එමින්



නව විහාර මන්දියට මුල් ගල් තැබීමට සූදනමින් 1992





ගරු දවුල්දෙන ඥානිස්සර මහනාහිමි, ගරු මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි
ගරු මාදුලුවාවේ සෝභිත නාහිමි, ගරු කහතුඩුවේ හේමසිරි නාහිමි දායක
සභාවේ සභාපති ෂෙල්ටන් දසනායක මහතා ද සමග නව විහාර මන්දිරය
විවෘත කිරීමට පෙර බුද්ධ වන්දනාවේ යෙදෙමින්



උත්සව සභාවක් අමතමින්, දෙහිවල හිටපු නගරාධිපතිනි
සුනේත්‍රා රණසිංහ මැතිනිය ද මෙහි සිටියි.



නව දෙමහල් බෝධි ප්‍රාකාරයට මුල්ගල් තැබීම.
ගරු කිතලගම හේමසාර නාහිමියන් ඇතුළු මහා සංඝරත්නය සමග





පැරණි ධර්ම ශාලාවේ දායක සභා රැස්වීම අමතමින් තම
ගුරුදේවයන් වහන්සේලා සමග 1985



පැවිදි ශිෂ්‍යයන් සමග



ගමේ විහාරස්ථානයේ නායක හාමුදුරුවන් වහන්සේ විසින් සිදු කළ
කඨින පිංකම අවස්ථාවේ





ගමේ විහාරස්ථානයේ ඉදිකළ ධර්මශාලාව
විවෘත කළ උත්සව අවස්ථාවේ.



ගමේ විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකළ ධර්මශාලා මන්දිරය
විවෘත කළ අවස්ථාවේ.





ගමේ විහාරස්ථානයේ දහම් පාසල් දරුවන් සඳහා ඩෙස් බංකු බෙදා දෙමින්.



ගමේ විහාරස්ථානයේ කඨින පෙරහැර අවස්ථාවේ.




නුගේගොඩ ව්‍යාපාරික සංගමය සංවිධානය කළ
අක්ෂි සායනය සමාරම්භය





ශ්‍රද්ධා වෙසක් කලාපයේ සමාරම්භය අවස්ථාවේ



අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා සමග ව්‍යාපාරික
සංගමයේ සංවත්සර උත්සවයට සහභාගි වී



ව්‍යාපාරික සංගමයේ සංවත්සර මහා සභාව සංවිධානය කරමින්



උත්සව සංවිධානය





ව්‍යාපාරික සංගමයේ සංවත්සර මහා සභාව සංවිධානය කරමින්



කාරක සභා රැස්වීම



නව බෝධි ප්‍රාකාරය හා රන්වැට විවෘත කිරීමට පැමිණි.
අතිගරු ජනාධිපතිතුමා ගරු උඩුවේ ධම්මාලෝක හිමියන් ඇතුළු පිරිස සමග



අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන් දහම් පාසල් ශාලාව විවෘත කරමින්
ඒ. එම්. එච්. පවුසි, සුසිල් ප්‍රේමජයන්ත්, චම්පික රණවක, තිලංග සුමතිපාල
උදය ගම්මන්පිල යන ඇමතිවරුන් හා මන්ත්‍රීවරු මෙහි සිටිති.





ගරු ජනාධිපතිතුමන්ට පිරිත් ආශීර්වාද කරමින්
මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා ද මෙහි වේ.



පුනරුද පුණ්‍ය මහෝත්සවයේ සංවිධායක මණ්ඩලය සමග
අතිගරු ජනාධිපතිතුමන් සාකච්ඡාවක



උත්සව සභාවේ වැඩ සිටිමින්



අතිගරු ජනාධිපතිතුමන් සමග පිළිසඳරක





ජනාධිපතිතුමන් අතින් තිළිණ ලබමින්



ශිෂ්‍ය පුත්‍රයන් පැවිදි කරමින්



දිළිඳු පවුල් සඳහා වියලි සලාක බෙදාදුන් මොහොතක්



මොහාන් ලාල් ග්‍රේරු මැතිදුන් සමග උත්සව අවස්ථාවක දී.





ලේ දන් දෙමින්



2004 සුනාමි ආධාර ලබාදෙමින්



පින්නවල අලි අනාථාගාරයේ



සිය ගුරුදේවයන් සමගින් ගවයන්ට අභය දානය දෙමින්
චන්ද්‍රා සුභසිංහ මැතිණියද මෙහි සිටියි.





විදේශීය දූත පිරිසක් විහාරස්ථානයට පැමිණි මොහොතක්.



රේවත රාජකීය විද්‍යාලයේ දානමය පිංකමක් සංවිධානය කරමින්



ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීමට ගිය මොහොතක ගරු උඩවේ ධම්මාලෝක හිමි
සහ අත්තනායක එම්. හේරත් මැතිදුන් සමග



කාදිනල් මැල්කම් රංජිත් පියතුමන් මුණගැසී





අතිගරු මාදුලුවාවේ සෝභිත අතිගරු බෙල්ලන්විල
විමලරත්න නාහිමිවරුන් සමග



විශාරද එච්වඩ් ජයකොඩි ශූරීන් සමග



දෙමහල් ආවාසය විවෘත කළ දින



මියන්මාර් සංචාරය් දී බුරුම නාහිමියන් ගරු හේමසාර නාහිමියන් හා ගරු සිරිවිමල හිමියන් සමග



බුරුමයේ මණ්ඩලේ නුවර උපසම්පද පිංකමකට වැඩම කර



රැන්ගුන් නුවර ස්වේදගෝන් චෛත්‍ය ස්ථානයේ



මියන්මාර සංචාරයේ දී සමූහ ඡායාරූපයකට පෙනීසිටිමින් ගරු වැලිමඩ
චන්ද්‍රවිමල හා ගරු වැලිමඩ සාන්ත ශිෂය හිමිවරු ද මෙහි වැඩ සිටති

**මුද්‍රණය සඳහා විශේෂ අනුග්‍රහ**

කාන්ති ජයවර්ධන මිය

ගීතාල් පීරිස් මයා, තිරාණි පීරිස් මිය

අනුගි ලූවිස් දියණිය

තිලකා බණ්ඩාර වදුරුස්ස මිය

ඔවිදු රණ්දුනු පුතණුවන්

ගයාල් ජයතිලක මයා

රොහාන් ලියනගේ මයා

ඉසුරි චන්ද්‍රසිරි දියණිය

ඇතුළු දෙමාපියන් හා සිසු දරුවන්

දහම් පාසල (ඉංග්‍රීසි අංශය)



mQcH r;kfcda;s ia:úrhka yg ;=kqrejfka wkka; .=K
n,fhka ;j;a fndfyda l,la nqoaO Ydikhg yd iudchg
fiajdjka lsÍug Yla;sh ù¾hh ,efíjdhs m;uq'

